# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2091/50 - 2018 ඔක්තෝබර් මස 03 වැනි බදාදා - 2018.10.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සුරාබදු ආඥාපනත**

අංක 12/2018 දරන සුරාබදු නිවේදනය

**පානීය නොවන ස්ප්‍රීතු ආනයනය සඳහා වූ සුරාබද්ද**

කලින් කලට සංශෝධනය කරන පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරය වූ) 32 වන වගන්තිය සමඟ කියවිය යුතු 2, 12, 22 සහ 25 වන වගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මා මෙම නිවේදනය මඟින් 2018 පෙබරවාරි මස 21 දිනැති අංක 2059/32 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත අංක 07/2018 සුරාබදු නිවේදනයේ (b) ඡේදය පහත දැක්වෙන නව ඡේදය ආදේශ කිරීම මඟින් සංශෝධනය කරනු ලැබේ.

"(b) 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතෙහි 17 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹ ඇති යම් අපනයන අභිමුඛ නිෂ්පාදන සමාගමක් (මින්පසු මෙහි "ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමත නිෂ්පාදන සමාගම" ලෙස කියැවෙන), සුරාබදු නිවේදන අංක 07/2018 හි පළමුවන උපලේඛනයෙහි සඳහන් අයිතම, අමුද්‍රව්‍ය ලෙස භාවිතා කරමින් නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතයන්ගෙන් සියයට 100 කට නොඅඩු ප්‍රමාණයක් අපනයනය කරනු ලබන්නේ නම් සහ එම අපනයන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සහතික කරනු ලබන්නේ නම්, එකී අමුද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා වන සුරාබද්ද 2018 ඔක්තෝබර් මස 04 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අය නොකළ යුතු ය.

එසේ වුවද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමත එවැනි යම් නිෂ්පාදන සමාගමක් විසින් එහි නිෂ්පාදනයන්ගෙන් යම් කොටසක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය පරිදි දේශීය වෙළඳපොළට විකුණනු ලබන්නේ නම්, එකී සමාගම එම දේශීය වෙළඳපොළෙහි අලෙවි කරනු ලබන කොටස සඳහා ඉහත කී අංක 07/2018 දරන සුරාබදු නිවේදනයේ (a) ඡේදයෙහි නියම කරන ලද සුරාබද්ද ගෙවීම සිදු කළ යුතුය."

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2018 ඔක්තෝබර් මස 03 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

10 - 1011


1A - PG 4266 — 582 (2018/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*